EWIS PERIPHERALS (PVT) LTD.
(8) 10 OCT 2025
RECEIVED

මගේ අංකය - POST/HQ/CA/SB/PRO/SV/45/01/2025

ගණකාධිකාරි(මුද්දර)
නාරාහේන්පිට.
2025. 10 . 08

කළමණාකරු
Ewis Peripherals (Pvt) Ltd
.............................................

<u>මිල ගණන් කැඳවීමයි.</u>

තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර සුරක්ෂිතාගාරය සඳහා " ඡායා පිටපත් යන්ත්‍රයක් " සපයා ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

ඔබගේ ලංසුපත් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් පිටපත් 02කින් යුක්තව වෙනම මුද්‍රා තබා ලියුම් කවර දෙකක බහා 2025.10.17 දින ප.ව.2.00ට පෙර ලියුම් කවරයේ වම්පස කෙළවරේ "ඡායා පිටපත් යන්ත්‍රයක්" යනුවෙන් සඳහන් කොට ගණකාධිකාරි **(මුද්දර), මුද්දර** අංශය, නාරාහේනපිට, කොළඹ **05.** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් නාරාහේන්පිට මුද්දර අංශයේ ඇති ලංසු පෙට්ටියට පැමිණ බහාලිය හැකිය. මිල ගණන් සමඟ පහත ලියවිලි සම්පූර්ණ කර තිබිය යුතුය.

1. ඇමුණුම 01 අනුව සකස් කළ ලංසු පත්‍රිකාව
   (ලංසුපත්‍රය සම්පූර්ණ කර අත්සන් කර තිබීම අනිවාර්යය වේ.)
2. ඇමුණුම 02 අනුව පිරිවිතර
3. නිෂ්පාදකයාගේ අවසරපත(Manufacture's Authorization)
4. ගණුදෙනුකරුවන්ගේ ලැයිස්තුව(Client list)
5. ආයතනයේ විස්තර(Company profile)
6. වගකීම් කාලය(Warranty Period)
7. අලෙවියෙන් පසු සේවාවන්(After Sale Services)

ලංසු භාර ගැනීම 2025.10.17 දින ප.ව. 2.00ට අවසන් කරනු ලබන අතර එදින ප.ව 2.05ට ලංසු විවෘත කරනු ලබයි. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. විවෘත කිරීමේ අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

ප්‍රසම්පාදනය පිරිනමන ලංසුකරු විසින් ඇණවුම පිරිනමන දින සිට දින 15ක් තුළ සැපයිය යුතු අතර ඇණවුම ප්‍රමාද වන සෑම සතියකට 1% බැගින් උපරිමය 10%කට යටත්ව මුළු වටිනාකමෙන් ප්‍රමාද ගාස්තු අය කරනු ලැබේ.

ඔබට අවශ්‍ය යම් පැහැදිලි කර ගැනීමක් වේ නම් 011-2508332 දුරකථන අංකය අමතා අවශ්‍ය විස්තර ලබා ගන්න.

ගණකාධිකාරි (මුද්දර)

ගණකාධිකාරි (මුද්දර)